කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
2300166
2326606

කොමසාරිස් (ආදායම්)
ஆணையாளர் (வருமானம்)
Commissioner (Revenue)
2300160

කොමසාරිස් (පාලන හා මානව සම්පත්)
ஆணையாளர் (நிர்வாகம் / மனித வளம்)
Commissioner ( Admin / Human Resource)
2300163

ෆැක්ස්
பெக்ஸ்
Fax
2300165

ඊ-මේල්
ஈ மேல்
E-Mail
excisen@slt.lk

තැ.පෙ. අංකය
த.பெ.இல.
P.O.Box No
1417

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரி திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 34, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත. කොළඹ 02. இல.34, டப்.ஏ.டீ.ராமநாயக்க வீதி கொழும்பு 02. No 34, W.A.D.RamanayakeMw,Colombo 02.

මගේ අංකය. / எனது இல: / My No. ED/02/04/02/2021

ඔබේ අංකය. / உமது இல: / Your No.

දිනය / திகதி / Date 2020.09. 07

සුරාබදු ස්ථානාධිපතිවරුන් මගින්

ප්‍රධාන සුරාබදු පරික්ෂක/ සුරාබදු පරික්ෂකවරුන් වෙත

**<u>වාර්ෂික ස්ථාන මාරු - 2021</u>**
**<u>ප්‍රධාන සුරාබදු පරික්ෂක/ සුරාබදු පරික්ෂක</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2020.08.12 දිනැති වාර්ෂික ස්ථාන මාරුවීම් 2021 සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා බැඳේ.

02. ඒ අනුව වාර්ෂික ස්ථාන මාරුවීම් 2021 සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 2020.09.10 දින සිට 2020.09.25 දින දක්වා දීර්ඝ කරමි.

03. වාර්ෂික ස්ථාන මාරුවීම් 2021 සඳහා අයදුම්පත් මාර්ග ගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කල යුතු අතර ඒ සඳහා උපදෙස් පත්‍රිකාව මේ සමග අමුණා ඇත. තවද මාර්ග ගත ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් වල දැඩි පිටපත් සුරාබදු ස්ථානාධිපති/ සුරාබදු අධිකාරී හා සහකාර සුරාබදු කොමසාරිස් ගේ නිර්දේශ සහිතව මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

බුද්ධික වෙහෙරගොඩ
සුරාබදු කොමසාරිස් (පාලන / මානව සම්පත්)

අත් කලේ : ඒ. බෝදරගම
සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත් :
01. සුරාබදු කොමසාරිස්වරුන්
02. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන්
03. සහකාර සුරාබදු කොමසාරිස්වරුන්
04. සුරාබදු අධිකාරීවරුන්
05. සුරාබදු ස්ථානාධිපතිවරුන්
06. අදාළ වෘත්තීය සමිතිවල ලේකම්වරුන්

## මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් පිරවීමට උපදෙස්

01. 2021 වසර සඳහා ස්ථානමාරු ඉල්ලුම්පත්‍ර මාර්ගගත ක්‍රමය යටතේ කැඳවීමට ක්‍රමවේදයක් සකස් කර ඇත.

02. ප්‍රධාන සුරාබදු පරීක්ෂක/ සුරාබදු පරීක්ෂක/ සුරාබදු සැරයන් මේජර්/ සුරාබදු සැරයන්/ සුරාබදු කෝප්‍රල්/ සුරාබදු නියාමක/ කාන්තා සුරාබදු නියාමක/ සුරාබදු රියදුරු යන තනතුරු සඳහා එකම ආකෘති පත්‍රයක් පිළියෙළ කර ඇත.

03. www.excise.gov.lk යන දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය තුළ දැනට මෙම ආකෘති පත්‍රය සකස් කර ඇත.

04. මෙම ඉල්ලුම්පත්‍රය මාර්ගගත ක්‍රමය යටතේ පිරවිය හැකි සේ සකස් කර ඇති බැවින් පිරවීම ආරම්භ කිරීමට ප්‍රථම පහත විස්තර සූදානම් කර තබා ගන්න.

    I. ජාතික හැඳුනුම්පත් අංකය

    II. සේවා අංකය (සුරාබදු සැරයන් මේජර් තනතුරින් පහළ නිලධාරීන් සඳහා).

    III. වැටුප් අංකය (මාසික වැටුප් විස්තරයේ සඳහන්ව ඇති අංකය).

    IV. දෙපාර්තමේන්තුවට බැඳුණු දින සිට මේ දක්වා දෙපාර්තමේන්තුව තුළ ලැබූ ස්ථානමාරුවීම් පිළිබඳව සියලු විස්තර (අදාළ ස්ථානය/ එහි වැඩ භාර ගත් දිනය/ ස්ථාන මාරුවීම් ලද දිනය/ එම ස්ථානයේ රාජකාරී කළ කාලය යන තොරතුරු)

05. පිවිසිය හැකි ආකාරය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා තුන සඳහාම සකස් කර ඇත).

    I. www.excise.gov.lk යන දෙපාර්තමේන්තු වෙබ් අඩවියට පිවිසෙන්න.

    II. සිංහල මුල් පිටුවෙහි පුවත් සහ ඉසවු තීරුවෙහි ඇති අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ඉල්ලුම්පත්‍ර කැඳවීම 2021 click කරන්න / ඉංග්‍රීසි පිටුවෙහි Home Page / News & Event / Annual Transfer Application 2021 හි Read more (click) කරන්න

    III. පසුව මාර්ගගත ඉල්ලුම්පත්‍රය සහිත පිටුවට පිවිසෙනු ඇත.

    IV. මුල් පිටුවේ සඳහන් අදාළ විස්තර අනුව පිරවීම කරන්න.

    V. User name සඳහා තම ජාතික හැඳුනුම්පත් අංකය ද , password සඳහා වැටුප් අංකය ඇතුළත් කරන්න. (මාසික වැටුප් විස්තරයෙහි ඇතුළත් ය).

06. ස්ථානමාරුවීම් ලබන නිලධාරියා විසින් පිරවිය යුතු කොටස (පිටු අංක 01-04 දක්වා) පුරවා දිනය ද සටහන් කර (අත්සන අවශ්‍ය නැත) submit කරන්න. මේ සමඟ ඇති Print බොත්තම එක්වරක් එබීමෙන් ඔබ පිරවූ කොටස ද සහිත සම්පූර්ණ ඉල්ලුම්පත්‍රයේ PDF පිටපතක් බවට download වන අතර කාර්යාලයේදී එහි මුද්‍රිත පිටපතක් A4 ප්‍රමාණයේ පිටු පහකට මුද්‍රණය කර ගත හැකි ය.

07. ඔබ ඇතුළත් කළ තොරතුරු ද සහිතව ලබා ගත් පිටපතෙහි පස්වන පිට ඔබට ආසන්න අංශ ප්‍රධානී, සුරාබදු අධිකාරී සහ සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශ සහිතව ප්‍රධාන කාර්යාලයට තැපැල් කර හෝ අතින් ගෙනැවිත් භාර දීමට කටයුතු කරන්න.

08. ඔබ මාර්ගගත ක්‍රමයට ප්‍රධාන කාර්යාලයට එවනු ලබන පෞද්ගලික තොරතුරුවල රහස්‍යභාවය දෙපාර්තමේන්තුව තුළදී සුරකෙනු ඇත.

09. සිදුවන අඩුපාඩු නිවැරදි කර ගනිමින් මාර්ගගත ක්‍රමය යටතේ දත්ත ගෙන්වා ගැනීමට දරන උත්සාහය සාර්ථක කර ගැනීමට ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

වැඩි විස්තර කමල් මල්ලවආරච්චි මහතා (දුරකතන අංකය- 071 8921328) ඇමතීමෙන් ලබා ගත හැකි ය.